# යොවුන් පුරවැසියන් ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කිරීම.

යොවුන් පුරවැසියන් හට ඡන්දහිමි නාමලේඛනයට නම ඇතුළත් කරවා ගැනීම සඳහා අයදුම් කිරීම දැන් වඩාත් පහසුවෙන් මාර්ගගතව සිදුකල හැකිය.

01. ඒ සඳහා https://eservices.elections.gov.lk/ යන මැතිවරණ කොමිෂන් සභාවේ ඊසේවා වෙබ් අඩවියට පිවිසෙන්න.

02. එහි ගිණුමක් සාදාගෙන නොමැති නම් **Sigh Up** හරහා පිවිසී ගිණුමක් සාදා ගන්න




03. ගිණුම සාදා ගැනීමේදී මුරපදය (Password) සඳහා ඉංග්‍රීසි කැපිටල් අකුරක්, සිම්පල් අකුරක්, ඉලක්කමක් සහ @,#,&,!,~ වැනි විශේෂ සලකුණක් (සෑම වර්ගයකින්ම එකක් හෝ තිබිය යුතුය) අඩංගු වන පරිදි සකසා ගත යුතුය. [උදා - KAsun@2540.mee]

04. ගිණුම සාදා ගැනීම පිළිබඳ අපහැදිලිතාවයක් වේ නම් එහි Instructions යටතේ ඇති උපදෙස් කියවන්න.

05. ඔබ සාදාගත් ගිණුමේ පරිශීලක නාමය (මෙය අංක 12 කින් යුත් අංකයකි) සහ ඔබ සකසා ගත් මුරපදය යොදා ගිණුමට පිවිසෙන්න.

06. පුරවැසියන් සඳහා වන යොමුවෙන් යොවුන් පුරවැසියන් ලියාපදිංචි කිරීම වෙත පිවිසෙන්න




07. **මැතිවරණ කොට්ඨාසය :** යන්නෙන් ඔබේ මැතිවරණ කොට්ඨාසය (දිස්ත්‍රික්කය) තෝරාගන්න

08. **ගෘහ මූලිකයගේ ජා.හැ.අ. :** යන ස්ථානයට මවගේ හෝ පියාගේ ( ඔබ පදිංචි ගෘහයේ සිටින ඡන්ද හිමි නාමලේඛනයේ ලියා පදිංචි අයකුගේ ) හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ✓ යොදන්න.

09. එවිට පහලින් ඇති තොරතුරු සම්පූර්ණ වේ. සම්පූර්ණ නොවේ නම් ඔබ විසින් ඔබට අදාළ තොරතුරු ඇතුළත් කරමින් ඒවා නිවැරදිව සම්පූර්ණ කල යුතුය.

10. **නම :** යන ස්ථානයට ඔබේ සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ අකුරින් ඇතුළත් කරන්න. (මුලකුරු සමග නම ඇතුළත් නොකල යුතුය). මෙම නම ඡන්දහිමි නාමලේඛනයට ඇතුලත් කෙරේ.

11. ඇමුණුම් යන බොත්තම ඔබා ඔබගේ හැඳුනුම්පතේ ඡායාරූපයක් (දෙපසම) ඇතුලත් කරන්න. ඇතුලත් කර "**යොමු කරන්න**" බොත්තම ඔබා යළි පෙර පිටුවට පැමිණෙන්න.

12 **"Im Not A Robot"** ඉදිරියේ ඇති ☑ යොදා "**යොමු කරන්න**" බොත්තම ඔබා අයදුම්පත යොමු කරන්න.

13 ජංගම දුරකතනයට ලැබෙන යොමු අංකය සුරැකිව තබා ගන්න. අවශ්‍ය නම් පමණක් "බාගත කරන්න" බොත්තම ඔබා මාර්ගගත අයදුම්පතෙහි මෘදු පිටපත බාගත කර ඔබ ළඟ තබා ගන්න.

14. අයදුම්පත යොමු කිරීමේදී වරදක් සිදු වූයේ යළි ගිණුම හරහා පිවිසී වරද නිවැරදි කර යළි "**යොමු කරන්න**" බොත්තම ඔබා අයදුම්පත යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

15 මේ සම්බන්ධ අවශ්‍ය සියළු උපදෙස් භාවිතය සඳහා උපදෙස් යටතේ දක්වා තිබේ. එම උපදෙස් කියවා මෙම කාර්ය සිදු කිරීම ඔබට පහසුවකි.

© මැතිවරණ කොමිෂන් සභාව - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය
✉ eservices@elections.gov.lk